)ïYï ysñï'à ðñrïïñ
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

9 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සොඳුරු ආඥාදායක ලෙස හඳුන්වන්නේ,

(1) නළු නිළියන් ය. (2) අධ්‍යක්ෂකයා ය.
(3) පෙළ රචකයා ය. (4) ප්‍රේක්ෂකයා ය.

02 කදා වළලු නාට්‍ය කිනම් ජාතක කථාවක් පාදක කොටගත් නිර්මාණයක් ද?

(1) කුස ජාතකය (2) චුල්ල ධනුද්ධර ජාතකය
(3) සේරිවාණිජ ජාතකය (4) මහා පදුම ජාතකය

03 නාට්‍යයකට අනවශ්‍ය පුද්ගලයන් ලෙස සැලකෙන්නේ,

(1) සංගීතය (2) නර්තනය (3) ප්‍රේක්ෂකයා (4) පසුතල

04 වේදිකා නාට්‍යයක් රූපවාහිනී නාට්‍යයකින් වෙනස් වනුයේ,

(1) සජීවී කලා මාධ්‍යයක් නිසාවෙනි.
(2) ජීවිතයේ පැතිකඩක් අනුකරණය කරන නිසාවෙනි.
(3) සාමූහික ප්‍රයත්නයක් නිසාවෙනි.
(4) ප්‍රක්ෂකයින් උදෙසා නිර්මාණය වන නිසාවෙනි.

05 ''අභිනය'' යන්නෙහි අරුත වන්නේ,

(1) නව නළු රසයයි. (2) සතර අභිනයයි.
(3) ඉදිරියට පැමිණවීමයි. (4) අනුකරණයයි.

06 ''අභිනය සංකල්පය'' මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ,

(1) ස්ටැනිස්ලාවිස්කි ය (2) භරතමුනිවරයා ය
(3) බර්නාඩ් ෂෝ ය (4) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය

07 රූකඩ නාට්‍ය සඳහා වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) තබ්ලාව (2) ගැටබෙරය (3) හොරණෑව (4) තාලම්පට

08 නාට්‍ය නිර්මාණයක් සිදුකිරීමේ දී

(1) සාමූහිකව කළ යුත්තකි. (2) තනිව ඉදිරිපත් කළ හැකිය.
(3) ඕනෑම අයෙකුට කළ හැකිය. (4) පහසුවෙන් කළ හැකිය.

09 කදා වළලු නාට්‍ය මුල්වරට වේදිකා ගතවුයේ,

(1) 1955 දී ය. (2) 1958 දී ය. (3) 1959 දී ය. (4) 1960 දී ය.

10 ලෝක ස්වභාවයට අනුගත නොවන යම් නාටය ශෛලියක් වී ද එය,

(1) ලෝක ධර්මීය (2) නාටය ධර්මීය
(3) මිශ්‍රය (4) සතර අභිනය

11 ප්‍රේක්ෂකයා යම් සිද්ධි සමුදායක් නාට්‍ය පෙළ මගින් දකින්නේ

(1) රූපණය මගිනි. (2) සතර අභිනය මගිනි.

(3) සංවාද මගිනි. (4) නාට්‍ය පෙළ මගිනි.

12 භූමිකාවකට පරිවර්තනය වීමේ දී මානසික ශික්ෂණය ඇතිකරන රංග අභ්‍යාසයකි

(1) නමනීය අභ්‍යාස (2) දර්පණ අභ්‍යාස

(3) ශ්වසන අභ්‍යාස (4) තාපන අභ්‍යාස

13 නාට්‍යයක් සඳහා මුදල් වැය කරන්නා

(1) වේදිකා පාලකය (2) අර්ථපතිය

(3) අධ්‍යක්ෂකය (4) පෙළ මතක්කර දෙන්නාය

14 සමාරෝපයට පර්යාය වචනයකි

(1) ආරූඪ වීම (2) අනුකරණය (3) බාහිර (4) අභ්‍යන්තර

15 ''සැබෑ වස්තූන් නාට්‍යය සඳහා නුසුදුසු බව'' සඳහන් කර ඇති ග්‍රන්ථය වන්නේ,

(1) කාව්‍ය ශාස්ත්‍රයේ ය. (2) රූපණ විධික්‍රමයේ ය.

(3) නාට්‍ය ශාස්ත්‍රයේ ය. (4) අලංකාර ශාස්ත්‍රයේ ය.

16 අංගරචනය සඳහා භාවිතා නොකරන ද්‍රව්‍යයකි.

(1) පැන්කේක් (2) ලිප්ස්ටික් (3) ස්ප්‍රිට්ගම් (4) බැනර් පේන්ට්

17 මූලික වශයෙන් අංගරචනය

(1) සරල හා චරිතාංග ලෙස වේ. (2) බාහිර හා අභ්‍යන්තර වේ.

(3) සරල හා සංකීර්ණ වේ. (4) වෙස්වලා ගැනීම හා ආරූඪවීම ය.

18 දර්පණ අභ්‍යාස මගින් සිදුකරනුයේ,

(1) ශරීරය උණුසුම් කිරීමයි.

(2) මානසික ඒකාග්‍රතාවයයි.

(3) හඬ පාලනයයි.

(4) භාව නිරූපණය සඳහා ඇස් යොදාගැනීමයි.

19 ''සක්කාය දිට්ඨි'' නාට්‍ය නිර්මාණය

(1) එම්. එච්. ගුණතිලකයන්ගේ ය.

(2) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ය.

(3) ආර්. ආර්. සමරකෝන්ගේ ය.

(4) දයානන්ද ගුණවර්ධනයන්ගේ ය.

20 මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ස්වතන්ත්‍ර නිර්මාණ අතරට අයත්වන්නේ,

(1) බහින කලාව (2) මඟුල් ප්‍රස්ථාව

(3) හැංගිහොරා (4) වෙද හටන

21 දයානන්ද ගුණවර්ධනයන් විසින් 1961 නිෂ්පාදනය කළ නාට්‍යයකි

(1) බක්මහ අකුණු (2) නරිබෑණා

(3) කාමරේ පොරේ (4) පරාස්සයා

The National e-learning Portal for The General Education

22 බෞද්ධ අධ්‍යාපනයේ පුනරුදය සඳහා ගෙනගිය අරගලය නිරූපණය කළ නාට්‍යයකි

(1) ආනන්ද ජවනිකා (2) මධුර ජවනිකා

(3) ජීවන වංචාව (4) පිංගුත්තර

23 1957 දී ගුණසේන ගලප්පත්තියන් විසින් කවි නාඩගම් ශෛලිය අනුව නිෂ්පාදනය කළ නාට්‍ය නිර්මාණයකි

(1) මූදු පුත්තු (2) දෑස නිසා (3) සඳකිඳුරු (4) දේවතා එළි

24 ''අපේ කට්ටිය'' නම් නාට්‍ය කණ්ඩායම පිහිටුවාගත් නාට්‍යකරු ලෙස හැඳින්විය හැක්කේ,

(1) ගුණසේන ගලප්පතිති (2) දයානන්ද ගුණවර්ධන

(3) හෙන්රි ජයසේන (4) සුගතපාල ද සිල්වා

25 සුගතපාල ද සිල්වාගේ පරිවර්තන නාට්‍ය අතරට ගැනෙන්නේ

(1) දුන්න දූනුගමුවේ (2) මරාසාද්

(3) තට්ටු ගෙවල් (4) නිල් කට්රොල් මල්

26 අසඩක්, ගෲෂා, නටාලියා වැනි චරිත අඩංගු හෙන්රි ජයසේනයන්ගේ නාට්‍ය නිර්මාණයකි

(1) කුවේණි (2) දිරිය මව සහ ඇගේ දරුවෝ

(3) හුණුවටය (4) ජනේලය

27 හෙන්රි ජයසේනයන් විසින් නිෂ්පාදනය කළ නව නූර්තියකි

(1) සිරිසඟබෝ (2) පද්මාවතී (3) රාමායණය (4) වෙස්සන්තර

28 ඉතිහාස සිද්ධියකට නව අර්ථ කථනයක් සැපයූ නාට්‍ය නිර්මාණයකි

(1) සුදු සහ කළු (2) සුභ සහ යස

(3) ගගණ සරණ කුරුල්ලෝ (4) ස්ත්‍රී

29 ''ග්‍රීක සැටර්'' නාට්‍ය ඇසුරෙන් නිෂ්පාදනය කළ ''බෙරහඬ'' නාට්‍යයේ නිෂ්පාදකවරයා වන්නේ,

(1) හෙන්රි ජයසේන (2) සයිමන් නවගත්තේගම

(3) බන්දුල ජයවර්ධන (4) ගාමිණී හත්තොට්ටුවේගම

30 ''සකල ජන'' නාට්‍ය නිර්මාණයේ අනුවර්තන කෘතිය වන්නේ,

(1) ජෙඩර්මැන් ඇසුරෙනි. (2) ඉග් නෙවුමා ඉ ඇසුරෙනි.

(3) මදර් කරේජ් ඇසුරෙනි. (4) ද රයිවල්ස් ඇසුරෙනි.

31 ''විවෘත වීදි නාට්‍ය'' කණ්ඩායමේ පුරෝගාමියා වන්නේ,

(1) බන්ධුල ජයවර්ධන (2) ගාමිණී හත්තොට්ටුවේගම

(3) හෙන්රි ජයසේන (4) ජයලත් මනෝරත්න

32 ඉහත නාට්‍ය කණ්ඩායම විසින් ඉදිරිපත් කළ නාට්‍යයක් ලෙස

(1) ගුරු තරුව (2) ස්වර්ණමාලි (3) කමිසය (4) ස්ත්‍රී

33 වීදි නාට්‍ය පිළිබඳ නිශ්චිත සාධක හමුවන්නේ,

(1) 60 දශකයේ ය. (2) 70 දශකයේ ය.

(3) 80 දශකයේ ය. (4) 90 දශකයේ ය.

34 වැඩවසම් ආර්ථික ක්‍රමය, උඩරට ගම්මාන නවීකරණය වීම යන ලක්ෂණ අඩංගු නාට්‍ය නිර්මාණයකි

(1) තලමල පිපිලා (2) ගුරු තරුව (3) මහගිරිදඹ (4) පුත්‍ර සමාගම

35 වර්තමානයේ ඉංග්‍රීසි නාට්‍ය කලාවට සුවිශේෂී මෙහෙයක් කළ නිර්මාණකරුවෙකි,

(1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) හෙනිරි ජයසේන

(3) ජෙරොම් ලක්ෂ්මන් ද සිල්වා (4) ඊ. එෆ්. සී. ලුඩෝවයික්

36 මහාචාර්ය එස්. විද්‍යානන්දන් මහතාගේ නාට්‍ය නිර්මාණයකි

(1) කර්ණන් පෝර් (2) සංකරම්

(3) ලේ මිසරාබ් (4) ලයන් කිං

37 ''සංකරම්'' නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

(1) මහාචාර්ය විද්‍යානන්දන් (2) මහාචාර්ය මෞනගුරු

(3) ශිවතම්බි (4) කුලන්දායි ශන්මුගලිංගම්

38 පහත කරුණු අතුරෙන් අභ්‍යන්තර සමාරෝපයට අයත් වන්නේ,

(1) සංගීතය යොදාගැනීමයි. (2) අංග රචනයයි.

(3) චරිත මනෝභාවයයි. (4) වේෂ භූෂණයි.

39 ''පුන්‍යසේන ගුණසිංහ''යන්ගේ නාට්‍ය නිර්මාණයකි

(1) දෙපානෝ (2) දිත්තල කාලගෝල

(3) මඟුල් ප්‍රස්ථාව (4) බෝඩිංකාරයෝ

40 යම්කිසි කලා කෘතියක් ඉදිරිපත් කරන ආකෘති විලාසය

(1) ශෛලියයි. (2) සමාරෝපයයි.

(3) සතර අභිනයයි. (4) සංවාද භාවිතයයි.

(1 x 40 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. ප්‍රායෝගික පරීක්ෂණය ද ඇතුළත්ය.**

01 ඕනෑම රංග ශෛලියකට අනුව ජන කථාවක් හෝ ජාතක කථාවක් යොදාගනිමින් නාට්‍යෝචිත පෙළක් රචනා කරන්න. (ල. 10)

02 (1) ආහාර්ය අභිනයට අයත් අංග 3 ක් නම් කරන්න. (ල. 04)

(2) පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 5 ක් ලියන්න. (ල. 06)

03 (1) නාට්‍යයක ශෛලිය යනු කුමක් ද? (ල. 04)

(2) නාට්‍යධර්මී රංග ශෛලිය යන්න පහදා, එහි ලක්ෂණ 4 ක් ලියන්න. (ල. 06)

04 (1) අංග රචනය සඳහා යොදාගන්නා ද්‍රව්‍ය 5 ක් නම් කරන්න. (ල. 05)

(2) මූලික වශයෙන් අංග රචනය බෙදෙන කොටස් නම්කොට විස්තර කරන්න. (ල. 05)

05 (1) කදාවළලු නාට්‍යයේ නිර්මාණකරු නම් කරන්න. (ල. 02)

(2) එම නාට්‍යයට පාදකකොට ගත් කථා පුවත කෙටියෙන් දක්වන්න. (ල. 04)

(3) මෙම නාට්‍යයෙන් ප්‍රේක්ෂකයා වෙත ලබාදෙන රසය හා උපදේශ පිළිබඳ දක්වන්න. (ල. 04)

- ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 20 න් ලබාදෙන්න.